# ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

## 2025 වසර සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2025 වසර සඳහා පහත සඳහන් භාණ්ඩ හා සේවා සැපයීම වෙනුවෙන් ලියාපදිංචි වීමට කැමති පිළිගත් සැපයුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (අයදුම්පත් ආදර්ශ දක්වා ඇත)

**(අ) භාණ්ඩ**

01. කාර්යාලීය ලිපිද්‍රව්‍ය (පරිගණක ලිපිද්‍රව්‍ය ඇතුළුව)
02. කාර්යාලීය උපකරණ
    i. ලී බඩු උපකරණ හා වානේ ගෘහ භාණ්ඩ
    ii. පරිගණක යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර ආදිය
    iii. වායු සමීකරණ යන්ත්‍ර
    iv. ගිනි නිවීමේ උපකරණ
03. පරිගණක මෘදුකාංග අනෙකුත් පරිගණක උපාංග
04. වෙබ් අඩවි නිර්මාණය, පරිගණක ජාලකරණය
05. නිල ඇඳුම් සඳහා රෙදි
06. මෝටර් රථ අමතර කොටස් (බැටරි, ටයර් හා ටියුබ් ඇතුළුව)
07. සෞඛ්‍ය සඳහා අවශ්‍ය
    i. විශබීජ නාශක හා සේදුම් ද්‍රව්‍ය
    ii. ඉදල්, කොසු, රේක්ක, බාල්දි ආදී උපකරණ
08. වීදි පහන් උපකරණ හා විදුලි උපාංග
09. ක්‍රීඩා උපකරණ
10. ගම් බූට්ස්, ලෙදර් බෑග්, වැහි කබා ආදිය
11. ඉදිකිරීම් ද්‍රව්‍ය
    i. ගල්, වැලි, පස් ආදිය
    ii. පෙරනිමි කොන්ක්‍රීට් නිෂ්පාදන (හියුම් පයිප්ප/කොන්ක්‍රීට් කුට්ටි ගල් ආදිය)
    iii. සියලුම හාඩ්වෙයාර් අයිතම

**(ආ) සේවා**

01. සියලුම මුද්‍රණ සේවා (පොත් බැඳීම ඇතුළුව)
02. යතුරුලියන, පරිගණක, ෆැක්ස්, ඡායා පිටපත් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම
03. i. සියලුම වාහන සේවා කිරීම
    ii. වාහන අලුත්වැඩියා කිරීම
04. වාහන කුලියට සැපයීම (ත්‍රීරෝද රථ, වෑන්, ටිපර්, ට්‍රැක්ටර්, බැකෝ යන්ත්‍ර ආදිය)
05. වායු සමීකරණ අලුත්වැඩියා කිරීම සහ සේවා කිරීම
06. පුවත්පත් දැන්වීම් පළ කිරීම
07. අනතුරුදායක ගස් ඉවත් කිරීම

**ආදර්ශ අයදුම්පත**

## 2025 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත

01. ව්‍යාපාරික නාමය හා ලිපිනය :..................................................................
02. ලියාපදිංචි අංකය හා දිනය :..................................................................
03. ලියාපදිංචිය අපේක්ෂා කරන අයිතමය :..................................................................
04. දුරකථන අංකය හා ෆැක්ස් අංක :..................................................................
05. බැංකුවේ නම හා ලියාපදිංචි අංකය :..................................................................
06. මෙම ආයතනයට ලබා දිය හැකි ණය පහසුකම් :
    කාලසීමාව
    ..................................................................................................................
    වටිනාකම
    ..................................................................................................................
07. 2024 වර්ෂයේ භාණ්ඩ හා සේවා සැපයූ රාජ්‍ය ආයතනවල ලැයිස්තුවක් :
    ..................................................................................................................
    ..................................................................................................................
    ..................................................................................................................
    ..................................................................................................................
08. ලියාපදිංචි ගාස්තු ගෙවනු ලබන්නේ මුදලින් ද, චෙක්පත් මගින් ද යන්න(චෙක්පත් මගින් නම් චෙක්පත් අංකය හා දිනය සඳහන් කරන්න) ..................................................................

.................................................... ....................................................

දිනය අත්සන (මුද්‍රාව සහිත)

01. ඉහත ආකෘතිය අනුව සකස් කරගත් අයදුම්පත් 2024.12.15 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතු ය.
02. ලියාපදිංචිය එක් අයිතමයක් සඳහා රු. 3,000/- ක මූලික ගාස්තුවක් චෙක්පත් මගින් හෝ පැමිණ මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් එවීමේදී, **"ලේකම්, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව"** නමින් චෙක්පත් එවිය යුතුය.
03. තැපෑලෙන් එවනු ලබන සියලුම අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ වම්පස **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2025"** යනුවෙන් සඳහන් කළ යුතුය.
04. ඉල්ලුම් කළ විට මිල ගණන් ඉදිරිපත් නොකරන ඇණවුම් කළ පසු නියමිත පරිදි භාණ්ඩ හා සේවා සැපයීමට අපොහොසත් වන සැපයුම්කරුවන් ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.
05. ලියාපදිංචි සැපයුම්කරුවන් වෙතින් අවශ්‍ය පරිදි මිල ගණන් කැඳවනු ලබන අතර, අවශ්‍යතාවය අනුව වෙනත් බාහිර සැපයුම්කරුවන්ගෙන්ද මිල ගණන් කැඳවා මිලදී ගැනීම් හා සේවා ලබාගැනීමේ අයිතිය ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතුවේ.

**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි වන සැපයුම්කරුවන් සඳහා තිබිය යුතු නිර්ණායක**

I. සංස්ථාවක් නම් සංස්ථාවක් ලෙස නීතිගත කළ බවට දෙන සහතිකය
II. තනි පුද්ගල ව්‍යාපාරයක් නම්, ලියාපදිංචි කිරීමේ සහතිකය
III. සමාගමක් නම් සමාගම් පනත අනුව ලියාපදිංචි කිරීමේ සහතිකය
IV. මීට පෙර භාණ්ඩ හා සේවා සැපයූ රාජ්‍ය ආයතන පිළිබඳ විස්තර තහවුරු කරන ලේඛන එවිය යුතුය.
V. වෙනත් විශේෂ සුදුසුකම් ඇත්නම් සඳහන් කරන්න.

**ලේකම් හා බලතල, කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,**
**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.**
**දුරකථන අංකය : 036-2258012/14**